# මහනුවර යුගයේ පිළිමගෙය තුළ අනිවාර්යය අංගයක් වූ මකර තොරණේ සුවිශේෂීත්වය පිළිබඳ අධ්‍යයනයක් (දනකිරිගල පුරාණ ලෙන් විහාරය ආශ්‍රයෙන්)

**නිශ්ශංක.ඊ.ඒ.එන්,[1] කුමාරි.ආර්.එම්.ටී.බී,[2] වික්‍රමරත්න.ඩබ්ලිව්.එස්.එන්.[3]**

මහින්දාගමනයෙන් පසු මෙරටට හඳුන්වාදුන් බෞද්ධ කැටයම් කලාවේ සුවිශේෂීත්වයක් හිමිවන මකර තොරණ වෙහෙර විහාරස්ථානවල සහ විහාර මන්දිර අභියස ප්‍රවිෂ්ට දොරටුවේ දක්නට ලැබේ. ගම්පොළ යුගයෙන් ඇරඹී පිළිම ගෙය තුළට මකර තොරණ පිවිසීම මහනුවර යුගය වනවිට අනිවාර්යය වාස්තු විද්‍යාත්මක අංගයක් බවට පත්විය. මහනුවර යුගයේ විහාරස්ථානවල විහාර මන්දිරයේ ප්‍රවිෂ්ට ද්වාරයන්හි උපුල්වන් දෙවියන්ගේ ආරක්ෂාව පතා ඉදිකළ මකර තොරණ ප්‍රවිෂ්ට ද්වාර හැරුණුවිට ප්‍රතිමා ගෘහයේ පසුතලයේ උදාරත්වය හා පෞරුෂත්වය ප්‍රකට කරවන අනිවාර්යය අංගයක් විය. මැටි බදාමවලට අමතරව ලී හා ශෛලමය වශයෙන් මෙකී මකර තොරණ් නිර්මාණය කෙරිණි. මහනුවර යුගයේ නායක්කර් රාජ්‍ය වංශික බලපෑම මත මකර තොරණ දෙපස මකරුන් දෙදෙනා කීර්තිමුඛ නම් වූ රෞද්‍ර මුහුණකින් මුදුනේදී එකට සම්බන්ධ වේ. මෙහි පර්යේෂණ ගැටළුව වන්නේ මහනුවර යුගයේ මකර තොරණ්හි සුවිශේෂීත්වය කුමක්ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණය ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදයන් ඔස්සේ අධ්‍යයනයට බඳුන් කරනු ලැබේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මහනුවර යුගයේ මකර තොරණ්වල සුවිශේෂීත්වය දනකිරිගල පුරාණ ලෙන් විහාරය ආශ්‍රයෙන් හඳුනා ගැනීමයි. මහනුවර යුගයේ මෙකී සුවිශේෂීත්වය විදහාපාන පෞරාණික විහාරස්ථානයක් ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාට්ටගම ග්‍රාමයේ කඳු ගැටයක පිහිටි දනකිරිගල පුරාණ ලෙන් විහාරය හඳුනා ගත හැකිය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ සිත්තරෙකු වූ දෙවරගම්පළ සිල්වත් තැන නම් හිමිනම විසින් නිර්මිත චිත්‍ර හා මූර්තීහි අංග සම්පූර්ණ බව හා විචිත්‍රවත් බව මෙහි මකර තොරණ් තුළින් මනාවට දැක්වේ. මහනුවර යුගයේ මකර තොරණ්හි ලක්ෂණ කියාපාමින් මැටි බදාමවලට අමතරව දැවයෙන් කරන ලද විශිෂ්ට ගණයේ මකර තොරණක් දනකිරිගල විහාරයේ ප්‍රවේශ ද්වාරයේ දක්නට ලැබුණි. මැටියෙන් කළ, හුණු බදාම ආලේප කළ, හිඳි බුද්ධ ප්‍රතිමා තෙනමක ඉහළින් ඊටම කුඩා කවාකාර හැඩයක් තුළ වූ කුඩා පාරාසයක නිර්මිත මෙම මකර තොරණ්හී දෙපස නීල වර්ණ දේව රූප දෙකක් සහ සතරවරම් දෙවිවරු දැක්වේ. හිස් අවකාශය විවිධ රටාවන්ගෙන් යුක්ත වන මෙහි නිල්, කහ සහ රතු වර්ණ ත්‍රිත්වයෙන් වර්ණවත්ව තිබේ. ප්‍රවිශ්ය ද්වාරයෙන් ඔබ්බට ගොස් බුද්ධ ප්‍රතිමාවලට අනිවාර්යය අංගයක් වූත් සීමිත වර්ණ සංකලනයකින් විචිත්‍රවත් වූත් දකනිරිගල ලෙන් විහාරයේ මකර තොරණ් තුළින් මහනුවර යුගයේ මකර තොරණ්හි විශිෂ්ටත්වය මනාව විදහා දැක්වෙන අතර ඒවා වර්තමානය වනවිටත් ප්‍රතිසංස්කරණය නොවීම මත මෙහි පුරාවිද්‍යාත්මක අගයද ඉහළ ගොස් තිබේ.

**මුඛ්‍ය පද :** මහනුවර යුගය, මකර තොරණ, දනකිරිගල, බුද්ධ ප්‍රතිමා, ද්වාර

[1,2,3] සමාජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරටවිශ්ව විද්‍යාලය. nimashanishshanka@gmail.com